museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2022 දෙසැම්බර්

**ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය 'මුණගැසීම්හි' තුන්වන වටමාරුව විවෘතකරයි.**

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) 2022 දෙසැම්බර් 8 දින 'මුණගැසීම්' ලෙස නම්කළ සිය ප්‍රදර්ශනයේ තුන්වන වටමාරුව විවෘතකරයි. මෙම ප්‍රදර්ශනය 2023 මාර්තු 19 දක්වා ක්‍රෙස්කැට් බූලෙවාඩයේ ඇති කෞතුකාගාර පරිශ්‍රයේදී මහජනයාට නැරඹිය හැක. MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සහ MMCA ශ්‍රී ලංකාහි අභිරක්ෂක සන්දෙව් හැන්ඩි විසින් අභිරක්ෂණයකළ 'මුණගැසීම්' 2022 පෙබරවාරි 11 දින විවෘතවූ අතර, 2022 මාර්තු 19 දින මහජනයාට වැසෙනු ඇත. ප්‍රදර්ශනයට නොමිලේ ඇතුළුවිය හැක.

'මුණගැසීම්' තුන්වන වටමාරුව ඒ. මාක් (1933–2000), ජෝර්ජ් කීට් (1901–1993), නෙලුන් හරස්ගම (b. 1959), සහ ජනනි කුරේගේ (b. 1974) කලාකෘති ඇතුළත් නව සංදර්ශක දෙකක් හඳුන්වාදෙයි. ඇඳුම්වලට අවධානය යොමුකරමින්, නව සංදර්ශකවලින් එකක් ඇඟලුම්, ඒවායේ කාර්යිකත්වයෙන් ඔබ්බට ගොස්, සමාජ පන්තිය, වෘත්තීය මට්ටම, ස්ත්‍රීපුරුෂභාවය, සහ ජාතිකත්වය පිළිබඳ තොරතුරු ඇඟවිය හැකි ආකාරය දෙස බලයි. මෙම සංදර්ශකය ජෝර්ජ් කීට්ගේ 'Kandyan Bride' (1951) නම් සිතුවම හා අභිවාහ්‍ය කලාකාරිනී ජනනි කුරේගේ 'Osariya' (2015) නම් අභිවහනයක කොටසක් ලෙස පැළඳි කටුකම්බි ඇඳුම අතර විශ්මයජනක සන්නිධානයක් ගෙනහැර දක්වනවා. මෙම කලාකෘති දෙක ශ්‍රී ලංකාවේ උඩරට සාරිය නොහොත් 'ඔසරිය' දෙස බලන විවිධ ආකාරයන් සංසන්දනය හා විසංසන්දනයකිරීමට ප්‍රේක්ෂකයින්ට ආරාධනාකරමින්, ඇඳුම්-පැළඳුම් සහ සමාජ අනන්‍යතාවය අතර ඇති ඓතිහාසික සබඳතා ඉස්මතුකරයි.

"ජෝර්ජ් කීට් සහ ඔහුගේ සිතුවම්වල, විශේෂයෙන්ම ඔහුගේ කාන්තා නිරූපණවල, අන්තර්ගත දේශපාලන ප්‍රතිරාවයන් නැවත සලකා බැලීමට මෙම සංදර්ශකය උපකරවනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. මෙම මුණගැසීම අපට නැවත කීට් සලකා බැලීමට පමණක් නෙවෙයි, රාජ්‍ය සේවයේ නියුතු කාන්තාවන්ට අදාළ ප්‍රසම්පාදක රීති පිළිබඳ මෑතකදී ඇතිවූ මහජන විරෝධතාවයේ දක්නට තිබූ පරිදි,,

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

ජාතික අනන්‍යතාවයක් නිර්මාණයකිරීමේදී ඇඳුම්වල භූමිකාව තවදුරටත් ප්‍රශ්නකිරීමට අපව යොමුකරනවා" යැයි හැන්ඩි අවධාරණයකළේ ය.

දෙසැම්බර් 8 දින විවෘතකළ දෙවන නව සංදර්ශක ද ජෝජ් කීට්ගේ සිතුවමකින් පෙලඹවී ඇති නමුත්, අධ්‍යාත්මික ස්වභාවයක මාතෘකාවකට අවධානය යොමුකරයි. මෙහි, ජෝජ් කීට්ගේ 1949 'The Offering' නම් සිතුවම, කුරුසිපත්කිරීමේ නිරූපණයන් ගවේෂණයකරන කලාකෘති තුනක් සමග සංවාදයක තබා ඇත. මෙම සංදර්ශකයේ නෙලුන් හරස්ගම සහ ඒ. මාර්ක්ගේ කලාකෘති හා, කුරුසිපත්කිරීමේ විෂය සිතුවම්කළ තවත් ජෝර්ජ් කීට් කලාකෘතියක් ඇතුළත් වේ.

MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා පැවසුවේ, "ජෝජ් කීට්ගේ 'The Offering' සමකාලීන කලාකරුවන් දෙදෙනෙකුගේ කුරුසිපත්වීම මත පදනම්වූ කලාකෘති පසෙකින් පෙන්වීම, අපට 'මුණගැසීම්හි' කලාකෘති අතර නිර්මාණයකිරීමට අවශ්‍ය වූ ආකාරයේ ම පෙළඹවීම්වෙනවා. ජෝජ් කීට්ගේ තනි සිතුවම් මහජන ප්‍රදර්ශනයේ තැබූ ශ්‍රී ලංකාවේ පළමු ප්‍රදර්ශනය ලෙස, ඔහුගේ සැබෑ කලාකෘති ආමන්ත්‍රණය නොකළ, යල් පැන ගිය කලා ඉතිහාසය හෝ 'රසඥතාව' බිඳ දැමීමේ කායී 'මුණගැසීම්' ආරම්භකරනවා. අපේ ප්‍රවේශය කීට් සහ ඔහුගේ පරම්පරාවේ අනෙකුත් කලාකරුවන් පිළිබඳ වඩාත් විවේචනාත්මක සාකච්ඡාවකට අනුබල දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා" යනුවෙනි.

සංදර්ශිත කලාකෘති සමග මහජනයා සම්බන්ධකරවීමට 'මුණගැසීම්හි' තුන්වන වටමාරුවට සමගාමීව නොමිලේ මහජන වැඩසටහන් මාලාවක් පැවැත්වෙනු ඇත. කලාකරුවන් සමග සතිපතා ගැලරි කතා, වෘත්තිකයින් සමග වැඩමුළු, සහ අභිරක්ෂකයින් හා බාහිර අධ්‍යාපනඥයින් සමග ප්‍රදර්ශන චාරිකා මෙයට ඇතුළත් වේ.

'මුණගැසීම්' සඳහා Goethe Institut සහ යුරෝපා සංගමයේ නොමසුරු සහය සහ, ෆෙයාෆස්ට් රක්ෂණ සමාගමේ සහ නිලූ ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගමේ අතිරේක සහය ලැබෙයි. 'මුණගැසීම්හි' ගුවන්විදුලි සහකරුවන්වන්නේ Lite 87, Rhythm World, සහ TNL Now ය.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය පිළිබඳ වැඩි විස්තර සඳහා, www.mmca-srilanka.org වෙත පිවිසෙන්න නැතිනම් facebook.com/mmcasrilanka පිටුව හෝ ඉන්ස්ටාග්‍රෑමයට instagram.com/mmcasrilanka/ පිවිසෙන්න.